# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 45 — 1973 පෙබරවාරි 02 වැනි සිකුරාද — 1973.02.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී).

## I වැනි කොටස: (II අ) වැනි ජේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 123 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 134 |


## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ අඳකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වනනන් විසින් "ඇප තැබීම කළ යුතුය" සි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සෙවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ජේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

123— ඝ 70786—16,266 (73/2)

අංක ජීඊ/1/10/1

**රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය**

සහකාර නීති උපදේශක තනතුර

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර නීති උපදේශක තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන අයදුම් පත්‍ර පුරවා 1973 පෙබරවාරි මස 24 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ මා වෙත ලැබෙන සේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

**සටහන :**

ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ පිළිබඳ ලිපියක් හෝ තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් ගැන සලකා බලනු නොලැබේ. අන්තිම දින තෙක් ඉල්ලුම් පත් ප්‍රමාද කරන අයදුම්කරුවන් එසේ ප්‍රමාද කළ යුත්තේ තමාගේ වගකීම පිට ය.

2. **සේවයට බඳවා ගැනීම සහ සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකු විය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—තනතුරට අයත් වන්නේ වර්ෂයකට රු. 11,520 කින් ආරම්භ වී රු. 480.00 වාර්ෂික වැටුප් වැඩිවීම් 9 කින් හා රු. 600.00 වාර්ෂික වැටුප් වැඩිවීම් 3 කින් රු. 17,640 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුප් ක්‍රමයකි.

(1969. 10. 1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 8,800—480×9/600×2—14,400 කි. රු. 11,280 දී අවුරුදු 2 ක නැවතීමක් සහිතව.)

**සටහන :**

තෝරාගනු ලබන අයදුම්කරු, තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දින සිට දෙවර්ෂයක් ඇතුළතදී සිංහල භාෂා විෂයයෙන්, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සාමාර්ථ ලැබිය යුතුය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට නොහැකිවීම වැටුප් වැඩිවීම් විලම්බනය කරනු ලැබීමට හේතුවනු ඇත.

4. **වයස් සීමාව.**—සෑම අයදුම්කරුවෙක්ම 1973. 2. 24 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයෙහි යෙදී සිටින නිළධාරීන් කෙරෙහි ඉහල වයස් සීමාව අදාල නොවේ.)

5. **අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියෙක් සහ අවුරුදු (5) පහකට නොඅඩු කාලයක් තුළ නීති වෘත්තීයෙහි යෙදුනු ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි නීතිඥයෙකු හෝ බැරිස්ටර් උපාධිධාරියෙකු විය යුතුය.

(ii) උපාධිය සඳහා හෝ අධි නීතිඥ විභාගය සඳහා හෝ බැරිස්ටර් විභාගය සඳහා හෝ පොදු ජාත්‍යන්තර නීතිය විෂයයක් වශයෙන් ගෙන සමත්ව තිබිය යුතුය.

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

**සටහන :**

පොදු ජාත්‍යන්තර නීතිය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ඇත්තාවූත්, ජාත්‍යන්තර සංවිධානවල සේවය කර ඇත්තාවූත්, ජාත්‍යන්තර නීති භාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික පළපුරුද්දක් ඇත්තාවූත් අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

6. ඉල්ලුම් පතෙක පහත සඳහන් ලියකියවිලි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බව්තීස්ම සහතිකයවත් අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද ලුහුඬු සහතිකවත් භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය.

(ඇ) චරිතය පිළිබඳ සහතික දෙකක්, ඉන් එකක් අධ්‍යාපනය ලැබූ ස්ථානයේ අධ්‍යක්ෂගෙන්, විද්‍යාල ගුරුවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය සහ/නොහොත් ප්‍රායෝගික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල සම්බන්ධයෙන් සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගයේ සහතිකය.

**සටහන :**

(i) ඉල්ලුම් පත්‍රයට ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිවක් අමුණා නොඑවිය යුතුය.

(ii) ඉල්ලුම්පතෙක ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිළධාරීන්ගේ අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

8. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධයෙන් කවර දැනුම්දීමක් හෝ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තැනට මිස මේ අමාත්‍යාංශයේ කිසියම් නිළධාරියෙකුගේ නාමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

වී. ටී. ජයසිංහ,  
ලේකම්,  
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු  
අමාත්‍යාංශය.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,  
තැ. පෙ. 572, ජනරජ ගොඩනැගිල්ල,  
කොළඹ 1,  
1973 ජනවාරි මස 22 වැනි දිනදීය.

2–70—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

අංකය : පුබෝ/ආය/20.

**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව**

අත්හදා බැලීමේ නිලධාරී තනතුර

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ අත්හදා බැලීමේ නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ ඉල්ලුම්පත් 1973 මාර්තු මස 2 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ තැ. පෙ. 1524, කොළඹ 7, ධර්මපාල මාවතේ අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් නො සැපයේ.

2. සේවයේ නියුක්ත කරලීමේ වගන්ති සහ කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු තුනක ආධුනික කාලයක් මතය.

(ii) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් වන බැවින් ඔවුන්ට රජයේ නිවාඩු දිනයන් සහ ඉරිදා දිනයන් විවේක දිනයක් සේ සැලකීමට නොහැකි වේ. නමුත් තමා නැති අවස්ථාවන්හි තමාගේ රාජකාරිය නිසි ආකාරයට කිරීමට කටයුතු සලස්වා ඕනෑම දිනයක, ඕනෑම වේලාවක විවේක ගැනීමට හැකිය.

(iii) තෝරා ගන්නා ලද අපේක්ෂකයින් තම පත්වීම් ලබා අවුරුදු 3 ක් ඇතුලත දී සිංහල පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා නියම සිංහල පරීක්ෂණ වලින් සමත්විය යුතුය. ප්‍රථම අවුරුද්ද තුලදී දෙමළෙන් වැඩ කිරීමේ දැනුමක් ද ලබා ගත යුතුය.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය.

ඒකාබද්ධ වැටුප :

II ශ්‍රේණිය—අවුරුද්දකට රු. 5,304—144×9—180×4—රු. 7,320. (අවුරුද්දකට රු. 6,024 ට පෙර කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක වේ.)

I ශ්‍රේණිය—අවුරුද්දකට රු. 7,500—180×3—240×2—රු. 8,520.

විශේෂ ශ්‍රේණිය—අවුරුද්දකට රු. 8,760—240×3—රු. 9,480.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සනාථදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙක්

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධරයෙක්

හෝ

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උද්භිද විද්‍යාව සහ රසායන විද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධිධරයෙක් විය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22 කට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුතු අපේක්ෂකයින් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපැවැත් වේ.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,

(ඇ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය,

(ඈ) ළඟ දී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම් කරුවන් මෙම උපවගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.)

**සංලක්ෂ්‍ය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම් කරුවන්ගේ ඉල්ලුම්පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතු යයි නිර්දේශ නොකරතොත් සලකා බලනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම තැ. පෙ. 1524, කොළඹ 7, ධර්මපාල මාවතේ අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ආචාර්ය ඊ. ජයනෙත්ති,
සුළු අපනයන බෝග අධ්‍යක්ෂ.

1973 ක්වූ ජනවාරි මස 19 දින,
තැ. පෙ. 1524, කොළඹ 7, ධර්මපාල මාවතේ,
සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ දීය.

### ආදර්ශ ඉල්ලුම්පත්‍ර ෆෝර්මය

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ 1973 මාර්තු මස 2 වැනි දිනට වයස :————.

4. ජාතිය හා එය කෙසේ ලබා ගත්තේ ද යන වග :————.

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) ඔහුගේ පියාගේ :————.
   (ඇ) ඔහුගේ පියපස මුත්තාගේ :————.
   (ඈ) ඔහුගේ පියපස මී මුත්තාගේ :————.

6. අයදුම්කරු කසාද බැඳලා ද, නැද්ද යන වග :————.

7. ලබා ඇති අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

8. සිංහල විෂයයන් සමත් වූ පරීක්ෂණය (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

9. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? එසේ නම් දරූ ධුරය සහ ඉන් අස්වීමට හේතු සඳහන් කළ යුතුය. :————.

10. යම්කිසි විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරුද්දක් ඇත් නම් සඳහන් කරන්න :————.

11. චරිත සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ තනතුරු නාමය :————.
    (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

12. වෙනත් විස්තර තිබේ නම් :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–63—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

### ජාතික නිවාස දෙපාර්තමේන්තුව

#### තක්සේරුකාර මණ්ඩලය

මෙම දෙපාර්තමේන්තුවෙන් ණය ලබාගැනීම සඳහා ණය අයදුම් කරුවන් විසින් ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන දේපල තක්සේරු කිරීමේ පරමාර්ථයෙන් දෙපාර්තමේන්තුවේ තක්සේරු කාර මණ්ඩලයට තෝරා ගැනීම් වස් තක්සේරුකාරයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. තක්සේරු වැඩ පිළිබඳ අවුරුදු 7 කට නොඅඩු පළපුරුද්දක් ඇති පුද්ගලයෝ අයැදුම් කිරීමට සුදුස්සෝ වෙති.

2. දෙපාර්තමේන්තුව මගින් මේ සඳහා පඩිනඩි හෝ දීමනා ගෙවනු නොලැබේ. දෙපාර්තමේන්තුව මගින් තීරණය කරනු ලබන ප්‍රමාණ වලට අනුරූපව ණය අයැදුම්කරුවන් විසින් තක්සේරු ගාස්තු සහ (ගමන් වියදම්) කෙලින්ම ගෙවා පියනු ලබන්නේ ය. ගාස්තු ආදිය සම්බන්ධ විස්තර මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

3. අයැදුම් ලියාපදිංචි තැපෑලෙන් "ජාතික නිවාස කොමසාරිස්, තැ. පෙ. 544, කොළඹ 2" යන ලිපිනයට 1973 පෙබරවාරි 15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. රාජ්‍ය සේවයේ අය තම තමන්ගේ අයැදුම් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. දැනට රාජ්‍ය සේවයේ නැති අය ස්වකීය සුදුසුකම් වලට සාක්ෂි වශයෙන් තමතමන්ගේ සහතික වල පිටපත් අයැදුම් සමඟ එවිය යුතුය.

4. දැනටමත් මණ්ඩලයේ සිටින්නේ නම් අයැදුම් කිරීම අනවශ්‍යය.

5. ආදර්ශ අයැදුමක් පහත දැක්වේ.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2,
1973 ජනවාරි 23.

### ආදර්ශ අයැදුම් ආකෘතිය

#### තක්සේරුකාර මණ්ඩලයට තෝරාගනු ලැබීම පිණිස වූ අයැදුම

1. අයැදුම්කරුගේ නම (සම්පූර්ණයෙන්) :————.
   මයා./මිය./මෙනෙවිය

2. පුද්ගලික ලිපිනය :————.

3. නිල ලිපිනය :————.

4. උපන් දිනය :————.

5. වෘත්තිය හෝ රක්ෂාව :————.

6. දැනට වැඩ කරන ස්ථානය :————.

7. මීට පෙර වැඩ කළ ස්ථානය :————.

8. අධ්‍යාපනික සුදුසුකම් :————.

9. පළපුරුද්ද :————.

10. සමර්ථ වී ඇති වෘත්තීය විභාග (දිනය සහිතව) :————.

11. පුද්ගලික වශයෙන් වෘත්තියෙහි යෙදීම ආරම්භ කළ දිනය හෝ රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ දිනය :————.

.................................................., වන මම මාගේ දැනීමේත් විශ්වාසයේත් හැටියට මෙහිලා ඇතුළත් කර ඇති විස්තර සැබෑ බවත් නිවැරදි බවත් මාගේ ගෞරවයේ නාමයෙන් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–64—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

යොමු අංකය : සාප/20/40

**අධ්‍යාපන අමාත්‍යාංශය**

II වන ශ්‍රේණියේ සැලසුම්කරු තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ II වැනි ශ්‍රේණියේ සැලසුම්කරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත් පිළියෙල කොට කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත (සාමාන්‍ය පරිපාලන ශාඛාව) 1973 පෙබරවාරි 23 වැනි දිනට කලින් ලැබෙන්නට සැලැස්විය යුතුය. දැනට රැකියාවක් කරන අයෙකු නම් ස්වකීය ඉල්ලුම් පත්‍රය ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුවේ. ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනට පසුව එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරන බව ද විශේෂයෙන් සැලකිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—වාර්ෂිකව රු. 3,432—21 × 144—රු. 6,456 ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් වේ. රු. 5,304 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

**සටහන.**—1969. 10. 1 දිනට ප්‍රථම මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 1,260—21 × 120—රු. 3,780 වේ.

3. සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.—

(i) තනතුර ස්ථිරය. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) අයදුම්කරුවන් තවදුරටත් සේවයෙහි යෙදීමට නුසුදුසු බව ආධුනික කාලසීමාව ඇතුළත හැඟී ගියහොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නම්, ආධුනික කාල සීමාව ඇතුළත හෝ එම කාලසීමාව අවසානයේ කලින් දැරූ තනතුරට නැවත පත් කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නො වේ නම්, සේවය නතර කරනවා ඇත.

(iii) පත්කරනු ලැබූ අය ආධුනික කාලය තුළදී සිංහල පිළිබඳව නියමිත ප්‍රවීනතාව ලබා නොගතහොත්, සේවය අවසන් කරනු ලැබීමට ඔහු යටත් වන්නේ ය. එහෙත් සිංහල ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා ඇත්ත වශයෙන්ම ප්‍රයත්නයක් දරා ඇති බව පත් කිරීමේ බලධාරියාට ඒත්තු යන අවස්ථාවලදී, සේවය අවසන් කිරීම පමා කළ හැකිය. නියමිත දිනට පසුව කිසියම් සාධාරණ කාල සීමාවකදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වූවහොත් පත්කිරීමේ බලධාරියාගේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් සිදුවී ඇති පාඩුව මකාලිය හැකිය.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—(1) ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට වැඩි විය යුතු අතර, අවුරුදු 40 කට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ නිලධාරීන්ට මෙම වයස් සීමාව අදාල නැත.

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත වීම.

(iii) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය සහ ඊට අතිරේකව පහත දක්වෙන සුදුසුකම් වලින් එකක් තිබිය යුතුය :—

(අ) පිළිගත් කාර්මික අධ්‍යාපන ආයතනයක සැලසුම් විෂයය ඇතුළත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් හෝ බලපත්‍රයක් (චාර්ටඩ්) ඉංජිනේරුවන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ සැලසුම් කටයුතු ඇතුළත් අවුරුදු 4 ක් අඛණ්ඩව ආධුනිකත්වයක සේවය කර තිබීම හෝ සැලසුම්කරුවෙකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයක හෝ දෙවර්ෂයකට වැඩි කාලසීමාවක් සේවය කර තිබීම

**හෝ**

(ආ) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ සැලසුම්කරුවකු වශයෙන් පස් වර්ෂයක් සේවය කර තිබීමය.

**සැ. යු.**—සෑම අයදුම්කරුවෙකුම ඉහත දක්වෙන කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් වන සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතික පත්‍ර හෝ පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා/හෝ වෘත්තීය සහතික පත්‍ර.

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ.)

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉහත සඳහන් 4 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයින්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. මුද්‍රිත අයදුම්පත් නොමැත. මෙහි පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත් පිළියෙල කරගත යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට කරන පත්කිරීම් සඳහා අදාල වන පොදු කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

9. සියලුම අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම්පත් භාර ගැනීම අවසන් කොට සති තුනක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් ඒ බව වහාම ලේකම්, සාමාන්‍ය පාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ 2 යන ලිපිනයට දැනුම් දිය යුතුය.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 2 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

යොමු අංකය සා.ප./20/40

ආදර්ශ ආකෘති පත්‍රය

II ශ්‍රේණියේ සැලසුම්කරු තනතුර—අධ්‍යාපන අමාත්‍යාංශය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(අ) පෙළපත් නම :————.

(ආ) අනෙක් නම් :————.

2. ලිපිනය :————.

3. ඉල්ලුම්පත්‍ර බාර ගන්නා අවසාන දිනට නියමිත වයස :————.
අවුරුදු :————, මාස :————, දින :————.

4. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————..

5. පුරවැසි බව සහ එය ලබාගත් අන්දම :————.

පහත සඳහන් අයගේ උපන් ස්ථානය සඳහන් කරන්න :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :——.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :——.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹුද යන වග (විවාහක නම් විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න) :————.

7. (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.

(ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා (ඉගෙනීම ලත් පාසල් හා විද්‍යාල, ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමග) :—

8. (අ) අධ්‍යාපන සුදුසුකම් (අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි.) :——.

(ආ) පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :————.

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් යමක් ඇතොත් දින සමඟ (පිළිගත් ආයතනවල සාමාජිකත්වය, ලැබූ ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකම් ඇතොත් ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. පාසල හෝ විද්‍යාල හැරයාමෙන් පසු කළ රක්ෂා, නියුක්තව සිටි හා හැරගිය දින සමග ලද වැටුප් :————.

11. විශේෂ අසිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම හෝ පළපුරුද්දකම් :—.

12. ඔබ ගැන කරුණු දැන ගැනීමට හැකි අයවලුන් තිදෙනෙකුගේ නම්, ලිපිනය හා තිලපල :————.

13. චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

14. ඔබ ණය ගැති කමින් නිදහස් ද? නො එසේ නම්, කොතෙක් දුරට ණය ගැති ද? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් දැනගතහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස් සතු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–66—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කාර්මික උපදේශක මණ්ඩලය

මෙම දෙපාර්තමේන්තුවේ කාර්මික උපදේශක මණ්ඩලයට තෝරා ගැනීම් වස්—

(1) අධිකාර ලත් නිර්මාණ ශිල්පීන් ;

(2) අධිකාර ලත් සිවිල් ඉංජිනේරුවන් ;

(3) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරුවන් (බී. එස්. සී. සිවිල් ඉංජිනේරු) ;

(4) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල වැඩ පරීක්ෂකවරුන් සහ එම ප්‍රධාන පරීක්ෂකවරුන් ;

(5) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සැලසුම් කාර්යාල සහකාරයින් සහ එම සැලසුම්කරුවන් ;

(6) වෘත්තීය නොවන සුදුසුකම් ලත්, රජයේ සේවයේ (සිවිල්) ඉංජිනේරුවන්, වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඉහත 3 සිට 6 එල්ලේ දක්වා ඇති තනතුරුවලින් විශ්‍රාම ලබා ඇති රජයේ සේවකයෝද අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

2. නිවාස ණය සඳහා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ගොඩනැගිලි සැලසුම් හා ද්‍රව්‍ය ප්‍රමාණ ලැයිස්තු ගැන වාර්තා කිරීමට දෙපාර්තමේන්තුව මෙම කාර්මික උපදේශකයින් හට නියම කරනු ඇත. මෙම කාර්මික උපදේශකයින් හට දෙපාර්තමේන්තුවෙන් පඩි නඩි කිසිවක් නොලැබේ. දෙපාර්තමේන්තුව මගින් තීරණය කරනු ලබන ප්‍රමාණවලට අනුරූපව ණය අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ගාස්තු සහ ගමන් වියදම් කෙලින්ම ගෙවා පියවනු ලබන්නේ ය. ගාස්තු ආදිය සම්බන්ධ විස්තර මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

3. අයදුම් ලියාපදිංචි තැපැලෙන් "ජාතික නිවාස කොමසාරිස්, තැ. පෙ. 544, කොළඹ 2" යන ලිපිනයට 1973 පෙබරවාරි 15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. රාජ්‍ය සේවයේ අය තම තමන්ගේ අයදුම් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. දැනට රාජ්‍ය සේවයේ නැති අය ස්වකීය සුදුසුකම් වලට සාක්ෂි වශයෙන් තම තමන්ගේ සහතිකවල පිටපත් අයදුම් සමග එවිය යුතුය.

4. ආදර්ශ අයැදුමක් පහත දැක්වේ.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2,
1973 ජනවාරි 23.

### ආදර්ශ අයදුම් ආකෘතිය

කාර්මික උපදේශක මණ්ඩලයට තෝරාගනු ලැබීම පිණිස වූ අයැදුම

1. අයදුම්කරුගේ නම (සම්පූර්ණයෙන්) :————.
(මයා./මිය./මෙනවිය)

2. පුද්ගලික ලිපිනය :————.

3. නිල ලිපිනය :————.

4. උපන් දිනය :————.

5. වෘත්තීය හෝ රක්ෂාව :————.

6. දැනට වැඩ කරන ස්ථානය :————.

7 මීට පෙර වැඩ කළ ස්ථානය සහ සේවා කාලය :————.

8. පළපුරුද්ද :————.

9. සමර්ථ වී ඇති වෘත්තීය විභාගය (දිනය සහිතව) :————.

10. ඔබ විශ්‍රාම ලත් රජයේ සේවකයෙක් ද? :—
(එසේ නම් අන්තිමට වැඩ කළ ස්ථානය, දැරූ තනතුර සඳහන් කරන්න) :————.

........................................ වන මම මගේ දැනීමේත් විශ්වාසයේත් හැටියට මෙහිලා ඇතුලත් කර ඇති විස්තර සැබෑ බව මාගේ ගෞරවයේ නාමයෙන් මෙසින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–67—73.02.02 අංක 45 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය :—

## සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි (ගොවිපල කළමනාකාරිත්වය) තනතුර

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (ගොවිපල කළමණාකාරිත්වය) තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 පෙබරවාරි මස 23 දින හෝ එදිනට කලින් හෝ කොළඹ 1, තැ.පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

සටහන.—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින කීපය දක්වා අයදුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අපේක්ෂකයන් විසින්ම විඳ දරා ගත යුතුය.

2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.— (1) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(2) තෝරා ගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජයේ යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නෙකු නම් ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 7,440—10 × 360 හා 11 × 480—රු. 16,320 (රු. 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

සටහන.—(i) නියමිත පශ්චාත් උපාධියකින් සමත් නොවූවහොත්, වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,520 පියවරින් ඔබ්බට යාමට කිසිම නිලධාරියෙකුට හිමිකමක් නැත.

(ii) නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවකු ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයට රු. 8,520 වැටුප් පියවරේ තබනු ඇත.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් තිබිය යුතුය ;

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධියක් තිබිය යුතුය.

**සටහන.**—පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ :—

(i) කෘෂිකර්මය පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබා ඇති අය ;

(ii) කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ පළපුරුද්දක් ඇති අය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. පශ්චාත් උපාධිධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස අවුරුදු 35 ක් වේ. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමා බල නොපැවැත් වේ.)

(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය ;

**සැළකිය යුතුයි.**—බව්තීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාරගනු නො ලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක් : මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂ ගෙන් විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය ;

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර ;

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන.**—(1) අයදුම්පත්වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(2) ඉල්ලූ අවස්ථාවක දී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින් ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 ජනවාරි මස 19 වැනි දින,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ.පෙ. 1652,
කොළඹ 1.

## ආදර්ශ අයදුම් පත්‍රය

### සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (ගොවිපල කලමනාකාරිත්වය) තනතුර සඳහා අයදුම් පත්‍රය

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————. මාසය :————. දිනය :————.
(ආ) ඉල්ලුම්පත්‍ර බාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :————. මාස :————. දින :————.

4. ඔබ ලංකා රට වැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය ;—
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහක ද, අවිවාහක ද, වැන්දඹුවක් ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. ...................... | ...... | ........... | 1. ...................... | ...... | ........ |
| 2. ...................... | ...... | ........... | 2. ...................... | ...... | ........ |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද ? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද ? :————

10. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක් ද ? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් : (ලබා ගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) :—

| සදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (1) .............................................. | ......... | ......... | ............ |
| (2) .............................................. | ......... | ......... | ............ |

**සැළකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—
(1) :————.
(2) :————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2-51/1—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

මගේ අංකය :

**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව**

පර්යේෂන නිලධාරි (ශෂ්‍ය විද්‍යාව) තනතුර

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (ශෂ්‍ය විද්‍යාව) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 පෙබරවාරි මස 23 දින හෝ එදිනට කලින් හෝ කොළඹ 1, තැ.පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

**සටහන.**—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින කීපය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අපේක්ෂකයන් විසින්ම විඳ දරා ගත යුතුය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(1) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(2) තෝරා ගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජය යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නෙකු නම්, ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 7,440—10 × 360 හා 11 × 480—රු. 16,320 (රු. 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

**සටහන.**—(i) නියමිත පශ්චාත් උපාධියකින් සමත් නොවුවහොත්, වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,520 පියවරින් ඔබ්බට යාමට කිසි නිලධාරියෙකුට හිමිකමක් නැත.

(ii) නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවකු ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 8,520 වැටුප් පියවරේ තබනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය;

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය හෝ එයට සම්බන්ධ විෂයයක් පිළිබඳ පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ ගෞරව උපාධියක් තිබිය යුතුය.

**හෝ**

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධියක් තිබිය යුතුය.

**සටහන.**—පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(1) කෘෂිකර්මය පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබා ඇති අය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. පශ්චාත් උපාධිධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස අවුරුදු 35 ක් වේ. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමා බල නොපැවැත් වේ.)

(ඈ) විශිෂ්ය චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

**සැලකිය යුතුයි.**—බවුතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාරගනු නො ලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් : මෙයින් එකක් අධ්‍යාපන පිළිබඳ අධ්‍යක්ෂ ගෙන් විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන.**—(1) අයදුම්පත් වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.

(2) ඉල්ලූ අවස්ථාවක දී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයින් ගේ අයදුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මඟින් එවිය යුතුය.

7. ඉල්ලුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 ජනවාරි මස 19 වැනි දින,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ.පෙ. 1652,
කොළඹ 1.

**ආදර්ශ අයදුම් පත්‍රය**

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (ශෂ්‍ය විද්‍යාව) තනතුර සඳහා අයදුම් පත්‍රය

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————, මාසය :————, දිනය :————.
(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :————, මාස :————, දින :————.

4. ඔබ ලංකා රට වැසියෙක් ද? පාරම්පරික රටවැසියෙක් ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද? යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශවයේ මී මුත්තා ගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහක ද, අවිවාහක ද, වැන්දඹු ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) .................... | ...... | ........ | (1) .................... | ...... | ........ |
| (2) .................... | ...... | ........ | (2) .................... | ...... | ........ |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද? :————.

10. ඔබ සාපරාධි වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න : ————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ය සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතන වල නම් සඳහන් කරන්න.) : ————.

12. දනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :————.

| | පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|---|
| (1) | ........................................ | ...... | .......... | .............. |
| (2) | ........................................ | ...... | .......... | .............. |

**සැලකිය යුතුයි—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.**

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) ————.

(2) ————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–51/2—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය.

---

මගේ අංකය :

**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව**

පර්යේෂණ නිලධාරි (නිෂ්පාදන ආර්ථිකය) තනතුර

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (නිෂ්පාදන ආර්ථිකය) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන්කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගනු ලබන අයදුම්පත් 1973 පෙබරවාරි මස 23 දින හෝ එදිනට කලින් හෝ කොළඹ 1, තැ. පෙ 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

**සටහන.**—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින කීපය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභහානි අපේක්ෂකයන් විසින් ම විඳ දරා ගත යුතු ය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(I) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අර මුදලට දායක මුදල් ගෙවිය යුතු ය. තෝරාගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(2) තෝරාගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජය යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නෙකු නම්, ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡෙදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 7,440—10 × 360 හා 11 × 480—රු. 16,320 (රු. 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත).

**සටහන.**—(i) නියමිත පශ්චාත් උපාධියකින් සමත් නොවූවහොත්, වැටුප් ක්‍රමයේ වර්ෂකයට රු. 11,520 පියවරින් ඔබ්බට යාමට කිසිම නිලධාරියෙකුට හිමිකමක් නැත.

(ii) නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවකු ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයට රු. 8,520 වැටුප් පියවරේ තබනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂ ඉදිරිපත් කළ යුතුය:—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය හෝ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ ගෞරව උපාධියක් තිබිය යුතු ය.

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය හෝ කාෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් තිබිය යුතුය.

**සටහන.**—පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(i) කෘෂිකර්මය පිළිබඳ ව ප්‍රයෝගික පුහුණුවක් ලබා ඇති අය.

(ii) කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ පළපුරුද්දක් ඇති අය.

(ඇ) අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. පශ්චාත් උපාධිධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස අවුරුදු 35ක් වේ. (දනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමා බල නොපැවැත් වේ.)

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

**සැලකිය යුතුයි.**—බවුතිස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නො ලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස් ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් : මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂගෙන් විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතු ය.

(ඇ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

**සටහන.**—(1) අයදුම්පත්වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිනිය යුතු ය.

(2) ඉල්ලු අවසථාවක දී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින් ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතු ය.

7. ඉල්ලුම්පත්‍ර ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 ජනවාරි මස 19 වැනි දින,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ. පෙ. 1652,
කොළඹ 1.

**ආදර්ශ අයදුම් පත්‍රය**

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (නිෂ්පාදන ආර්ථිකය) තනතුර සඳහා අයදුම් පත්‍රය

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුයි)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වූවහොත් එය වහා දනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ආ) ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස.—
වර්ෂ : ————. මාස :————. දින :————.

4. ඔබ ලංකා රට වැසියෙක් ද ? පාරම්පරික රට වැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න); ————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහක ද , අවිවාහක ද, වැන්දඹුවක් ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද ? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක් ද ? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. ————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් : ( ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතනවල නම් සඳහන් කරන්න: ————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් : (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න). :————.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න.

(1) ————.

(2) ————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————.

දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

2—51/3—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඩී. 47/3/43

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සුභසාධක ආයතන පිළිබඳ අධිකාරි තනතුර

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සුභසාධක ආයතන පිළිබඳ අධිකාරි තනතුර සඳහා අයදුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1973 පෙබරවාරි මස 26 දින හෝ ඊට පෙර කොළඹ 7, බාන්ස් පෙදෙසේ සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ 'සමාජ සුභසාධක ආයතන පිළිබඳ අධිකාරි තනතුර' යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලකට දායකයන් වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ, පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් වනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක කාලසීමාවක් ඇතුලතදී දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත්විය යුතුය. මෙම පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම ඔහුගේ පත්වීම අවසන් කිරීමට හේතු වේ. වර්ෂයකට රු. 9,600 එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින්ද සමත්වීමට ඔහුට නියම කෙරෙනු ඇත. නියමිත කාලය තුළ දී මෙම පරීක්ෂණයෙන් සමත් නොවුවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන් පසු ගෙවිය යුතු වාර්ෂික වැටුප් වැඩිවීම් ගෙවීම පරීක්ෂණයෙන් සමත් වන තෙක් පමා කෙරෙනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 6,720—12 × 360—11,040 වාර්ෂික වැටුප රු. 9,600 එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයක් ද වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1973.2.26 වැනි දිනට අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටීම හෝ,

(ii) වෛද්‍ය ආඥපනත අනුව ලියාපදිංචි වෛද්‍යවරයෙකු හෝ,

(iii) උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ලන්ඩන් අධ්‍යායන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනක් හෝ දෙවාරයක දී විෂයයන් හතරක් සමත්වීම හෝ එයට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව යටත් පිරිසෙයින් අවුරුදු 10ක රජයේ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූ ද, තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මෙම තනතුර සඳහා විශිෂ්ඨ සුදුසුකම් හා විශේෂ සාමාර්ථයක් ද ඇතැයි නිර්දේශ කරනු ලබන්නා වූ රජයේ නිළ ධාරීන් හෝ,

(iv) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිළධාරියෙකු වශයෙන් අඩුතරමින් අවුරුදු හතක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූද සමාජසේවා නිලධාරීන් හෝ විය යුත්තාහ.

**සටහන.**—පහත සඳහන් කරුණු ගැන සුදුසුකම් හෝ ප්‍රායෝගික අත්දැකීම් ලබා ඇති අයට විශේෂ සැලකීම් දක්වනු ලැබේ.

(i) වෘධයින් සහ අබලයින් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා නැත්නම් වෙනත් සමාජයීය හෝ ශාරීරික බාධක වලින් පෙලෙන්නන් රැකබලා ගැනීම සඳහා සමාජ සුභ සාධක සංවිධාන විසින් පවත්වනු ලබන ආයතන පාලනය කිරීමේලා පළපුරුද්දක් සහ,

(ii) සමාජ සේවා සුභ සාධක කටයුතු.

රජයේ සේවයේ නියුක්තව සිටින අයට මෙහි සඳහන් සුදුසුකම් ඇත්නම් වයස් සීමාව ගැන නොසලකා ඉල්ලුම් කළ හැක.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික හෝ භාරගනු නොලැබේ).

(ඊ) උපාධි හෝ උසස් අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් විය යුතුය.

(ඩ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඪ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ.යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලැබේ.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් මේ කාර්‍යාලයට ලැබුණු බව අයදුම් කරුවන්ට දන්වනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 7, බාන්ස් පෙදෙසේ,
සමාජ සේවා අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### සමාජ සුභසාධක ආයතන පිළිබඳ අධිකාරි තනතුර

1. නම (මුලකුරු සහිතව) :————. මහතා/මිය/මෙනෙවිය.

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
(ආ) එසේනම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද ?:————.

6. උපන් දිනය :————.
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස :————.
අවුරුදු :————. මාස :————. දින :————.

8. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :————.
(අ) තනතුර :————.
(ආ) ස්ථිර ද තාවකාලික ද ? :————.
(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.
(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
(උ) දෙපාර්තමේන්තුව :————.
(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
(ඍ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
(ඎ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල) ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතික ද ඇතුළත්ව :————.

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :————.

| | සහතිකය | නිකුත්කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතනය :————.

| | ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |
| 6. | | | | |
| 7. | | | | |

12. වෘත්තීය අධ්‍යාපන ලද ආයතනය :————.

| | ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4 | | | | |
| 5. | | | | |

13. කලින් දරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න :————.

| | දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද තාවකාලිකද? | සිට | දක්වා |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරුවී ඇත්තේද ? (එසේ නම්, විස්තර දන්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දන්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නොවේ නම් ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.

17. මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2—50—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/4/17 (ජී).

**සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ 'අ' ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය— 1973 පෙබරවාරි**

1972.12.29 වැනි දින අංක 40 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ නිවේදනයෙහි දක්වා ඇති ඉහත සඳහන් විභාගයේ අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය 1973 ජනවාරි මස 24 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ වැඩ බලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

2–101—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/59/19 (ජී)

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල විභාගය) — 1973 අප්‍රේල්**

**1. විභාග පවත්වන දිනය.**—1973 අප්‍රේල් මස 7.

සිංහල ලඝු ලේඛනය හා ටයිප් ගැසීම මැනවින් දත්, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයට බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් කොළඹ, කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, හම්බන්තොට යාපනේ, මන්නාරම, වවුනියාව, මඩකලපුව, අම්පාරේ, ත්‍රිකුණාමලය, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල, රත්නපුරය සහ කෑගල්ල යන මධ්‍යස්ථානයන්හි දී 1973 අප්‍රේල් මස 7 වෙනි දින පටන් පවත්වනු ලැබේ.

අපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති කිසි මධ්‍යස්ථානයක් වේනොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත.

**2. වැටුප් ක්‍රමය.**— මේ විභාගයෙන් සමත්වන අය වර්ෂයකට රුපියල් 3,864 න් පටන්ගෙන වර්ෂයකට රුපියල් 144 බැගින් වූ වැටුප් වැඩිවීම් වලින් රුපියල් 6,456 දක්වා නගින්නා වූ ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් සහිත ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට පත් කරනු ලබන්නාහ. මෙම වැටුප් ක්‍රමයෙහි රුපියල් 4,584 ට පෙර හා රුපියල් 5,736 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වේ.

**3. ඇබෑර්තු.**—රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් විසින් පාලනය කරනු ලබන යතුරු ලේඛක සේවයේ සිය පත්වීම් ස්ථිර කර ඇති නිලධාරීන් අතරේම තරඟ කිරීම සඳහා සම්පූර්ණ ඇබෑර්තු සංඛ්‍යාවෙන් 33⅓% ක් වෙන් කර තබනු ඇත. ඉතිරි ඇබෑර්තු සංඛ්‍යාව සේවයේ යෙදී සිටින යතුරු ලේඛකයින් සහ බාහිර අපේක්ෂකයින් සඳහා වෙන් කරනු ලබන අතර, ඔවුන් විභාගයේදී ලබාගන්නා කුසලතාවය අනුව පත්වීම් දෙනු ලැබේ.

**4. සේවා කොන්දේසි.**—(i) මෙම තනතුරු ස්ථිරය. පත්වීම කලින් අවසන් කරනු නොලැබුවහොත්, පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් හෝ එම කාලය දීර්ඝ කිරීම අවශ්‍යානුරූපයයි සලකනු ලැබුවහොත් එසේ දීර්ඝ කරනු ලබන කාලයක් හා පත්වීමෙහි ස්ථිර කරන බවට ලිපියක් ලැබෙනතෙක් පරිවාස තත්වයේ සේවය කළ යුතුය.

පරිවාස කාල සීමාව අවසන් වූ පසු අපේක්ෂකයන්ගේ පත්වීම ස්ථිර කිරීම ඔවුන්ගේ වැඩ හා හැසිරීම සතුටුදායකවීම මත රඳා පවතී. වාර්ෂික වැටුප රුපියල් 4,584 ක් වීමට පෙර හා රුපියල් 5,736 ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවීම විභාගයකින් සමත් වීම සහ වැඩ සහ හැසිරීම සතුටුදායක වීමද මත රඳා පවතී.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව, රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට පත් කරනු ලබන අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ සේවා ස්ථාන මාරු කරන්නටත් ලංකාවේ ඕනෑම තැනකට ඔවුන් පත් කරන්නටත් පිළිවන් කම තිබේ.

(iii) සාමර්ථ්‍ය ලැබූ අය 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලට ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලට ද මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලට ද එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

(iv) අතිරේක දීමනා සහ සේවාවේ වෙනත් කොන්දේසි දැන ගැනීම සඳහා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වැනි ඡේදයේ මුල පළවන ආණ්ඩුවේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

(v) තමන් පත්වීම ලබන කාර්යාලයේ තමන් පුහුණුව ලත් වර්ගයේ යතුරු ලියනයක් නොමැති නම් කාර්යාලයේ ඇති යතුරු ලියනවල යතුරු ලිවිය හැකි වන පරිදි රජය විසින් නියම කරනු ලබන කෙටි කාලීන පාඨමාලාවක් හදාරා අවශ්‍ය ප්‍රවීණතාව ලබා, ගත යුතුය.

**5. සුදුසුකම්—සාමාන්‍ය කොන්දේසි.**—(i) අපේක්ෂකයේ/අපේක්ෂිකාවෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තාහ.

(ii) අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ ලාංකිකයෝ විය යුත්තාහ.*

(iii) අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ පහත දැක්වෙන සහතික පත්‍රවලින් යටත් පිරිසෙයින් එකක්වත් ලබා තිබිය යුත්තාහ :—

(අ) අයැදුම්කරුවෝ විෂයයන් 6 කට නොඅඩුව භාෂාව ඇතුලු විෂයයන් 4 කට සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත්විය යුතුය. අංක ගණිතයට හෝ ශුද්ධ ගණිතයට හෝ වාණිජ අංක ගණිතයට හෝ මූලික ගණිත යට හෝ සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

(ආ) අයදුම්කරුවන් එකම වාරයකදී යටත් පිරිසෙයින් විෂයයන් 5 ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කට නොඅඩුව, භාෂාව ඇතුළු විෂයයන් 4 කට සම්මාන සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත්විය යුතුය. අංක ගණිතයට හෝ, ශුද්ධ ගණිතයට හෝ, වාණිජ අංක ගණිතයට හෝ, මූලික ගණිතයට හෝ සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

* රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම 'ලාංකික' යන වචනය විග්‍රහ කරනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් හෝ ලංකාවේ පුරවැසියන් වශයෙනි.

(ඇ) ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ වාණිජ සහතිකය ;

හෝ

(ඈ) ලංකාවේ අපේක්ෂකයන්ට නියමිත පරිපාටිය යටතේ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ (London Chamber of Commerce) වාණිජ අධ්‍යයන සහතිකය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝුලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යයන සහතිකය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝුලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) ; හෝ

(ඉ) ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce) සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වාණිජ අධ්‍යයන සහතිකය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) : හෝ උසස් වාණිජ අධ්‍යයන සහතිකය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝුලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) ; හෝ

(ඊ) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලවලින් ප්‍රදානය කරන ලද (ගණන් තබන්නන් සඳහා වූ හෝ ලඝු ලේඛක යතුරු ලේඛකයන් සඳහා වූ) වාණිජ සහතිකය හෝ උසස් වාණිජ සහතිකය.

**සැලකිය යුතුයි.**—මෙම විභාගයට අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනයට පෙර ප්‍රතිඵල පිට නොවී ඇති ඉහත සඳහන් කවර විභාගයකට හෝ පෙනී සිටි අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ අයදුම් පත් භාරගනු නොලැබේ.

(iv) 1973 අප්‍රේල් මස 1 වැනි දින වන විට අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ වයස අවුරුදු 17 ට නොඅඩුවත්, අවුරුදු 35 ට නොවැඩිවත් තිබිය යුතුය.

**6. යෝග්‍යතාව.**—ලංකාවේ පිහිටි එක්සත් රාජ්‍යයට අයත් සේවාවන්හි නියුක්ත වූ එහෙත් හේවා වසමට අයත් නොවන සේවකයන්ට හා යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූවන්ටද දෙනු ලබන විශේෂ අනුග්‍රහ.

(i) එක්සත් රාජ්‍යයට අයත් සේවාවන්හි යෙදී සිට 1956 ජූලි මස 6 වැනි දින හෝ ඉන් පසුව හෝ සේවයෙන් ඉවත් කරනු ලැබූ හේවා වසමට අයත් නොවන ලාංකික සේවකයෝ හෝ යුද්ධ කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව විසින් කරන ලද තීරණය නිසා සේවයෙන් ඉවත් කරනු ලැබීමට භාජනව සිටින අය ද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි පෙරිය කරච්චියට, නාරාහේන්පිට පිහිටි රාජකීය නාවික ගුවන් විදුලි මධ්‍යස්ථානය (ඇන්ඩර්සන් ගුවන්

විදුලි මධ්‍යස්ථානය) ගෙන යාමට ආණ්ඩුව මගින් කරන ලද තීරණය හේතු කොට ගෙන, 1954 සැප්තැම්බර් මස 27 වැනි දිනට පසුව සේවයෙන් ඉවත් කරන ලද අයද, පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙම ශ්‍රේණියට අයත් අපේක්ෂකයන්ට මෙහි 5 වෙනි ඡේදයෙහි (iv) කොටසෙහි නියමිතව ඇති වයස් සීමාව ගණන් ගැනීමේදී තමන් එක්සත් රාජධානියට අයත් සේවාවන්හි සේවය කළ කාලසීමාව තම වයසින් අඩු කිරීමට අවසර දෙනු ලැබේ. එහෙත් එසේ කිරීමට අවසර දෙනු ලබන්නේ ඔවුන්ගේ එම සේවා කාලය අඛණ්ඩවද, සතුටුදායකව ද පැවතියේ නම් පමණකි.

(ආ) එක්සත් රාජධානියේ සේවාවන් යටතේ යටත් පිරිසෙයින් සිවු අවුරුද්දක සතුටුදායක අඛණ්ඩ සේවයක් සපුරා සිටි එහෙත් 5 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපනික සුදුසුකම් නොමැති අයට ඉදිරිත් තමන් 8 වැනි ඡේදයේ (ii) (ආ) (අ) කොටස යටතේ සඳහන් වුණු විභාගවලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමාර්ථය ලබා ඇතොත්, මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ii) යුද්ධ හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අය පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙහි 5 වැනි ඡේදයෙහි (iv) වැනි කොටසෙහි දක්වන ලද වයස් සීමාව ගණන් ගැනීමේදී, අවශ්‍ය සහගත ලෙස සේවයෙන් නෙරපන ලද හෝ සේවයෙන් පහ කරන ලද හෝ අවශ්‍ය සහගත ලෙස සේවයෙන් නිදහස් කරන ලද හෝ කිසියම් දුරාචාරී බවක් නිසා සේවයෙන් අස්වීමට සිදුවූ හෝ තැනැත්තන් හැර සේවා මුක්ත වූ අන්‍යයන්ට හෙවත් ලප සේවකයන්ට හෝ නිලධාරීන්ට හෝ හේවායන්ට හෝ තමන් ස්ථිර හමුදාවේ සේවය කළ කාල සීමාව තම වයසින් අඩු කිරීමට අවසර දෙනු ලැබේ.

(ආ) අවුරුදු හතරකට නොඅඩු කාලයක් නිත්‍ය හට හමුදාවේ යෙදී සිටි එහෙත් මෙහි 5 වැනි ඡේදයෙහි (iii) වැනි කොටසෙහි දක්වන ලද අධ්‍යාපනික සුදුසුකම් නොමැති අයට ඉදිරිත් තමන් 8 වැනි ඡේදයේ (ii) (ආ) (අ) කොටස යටතේ සඳහන් කරන ලද විභාගයන් අතුරෙන් යටත් පිරිසෙයින් එකකින් වත් සාමාර්ථය ලබා ඇතොත් මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

**7. සේවක සංඛ්‍යාව අඩු කිරීමට සඳහා අස් කරනු ලැබූ ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ අනුග්‍රහ.**—ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ නිලයක යෙදී ආණ්ඩුවේ සේවය කළ එහෙත් ස්වකීය වැඩ හෝ හැසිරීම අසතුටුදායකවීම නිසා නොව, අන්‍ය වූ හේතූන් නිසා සේවය නවතාලීමට භාජන වූ අය පහත දැක්වෙන අනුග්‍රහය ලැබීමට සුදුස්සෝ වෙති :—

5 වැනි ඡේදයෙහි (iv) වැනි කොටසෙහි දැක්වුණු වයස් සීමාව ගණන් බැලීමේදී සේවයෙන් පහ කරනු ලැබීමෙන් හෝ වැඩ අසතුටුදායක වීමේ හේතුවෙන් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ආණ්ඩුවේ සේවයෙන් අස්වුණු අය හැර අන්‍යයන්ට තමන් ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටි කාලසීමාව තම වයසින් අඩු කර ගැනීමට අවසර දෙනු ලැබේ.

**8. 1 රජයේ සේවයේ යෙදී සිටින ස්ථිර සේවකයෝ.**—ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ එහෙත් 5 (iii) වැනි ඡේදයේ දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම් ලබා නොමැති රජයේ නිලධාරීන් ඔවුන් 1973 අප්‍රේල් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු නම් මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇත්තෝ වෙති.

(ආ) ඔවුන් රජයේ ලඝුලේඛක සේවයට පත් කිරීමට තෝරා ගනු ලැබුවහොත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තු වලින් මුදා හැරීමට කැමති විය යුතුය.

**8. 2 රජයේ සේවයේ යෙදී සිටින තාවකාලික සේවකයෝ.**—දැනට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත තාවකාලික ලඝු ලේඛකයන්ද, තාවකාලික යතුරු ලේඛකයන්ද, තාවකාලික ලිපිකරුවන්ද ඔවුන් 1973 අප්‍රේල් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි නම් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇත්තෝ වෙති. ඉහත 5 (iii) හි ඇති අධ්‍යාපනික සුදුසුකම් ඔවුන්ට අවශ්‍ය නොවේ.

**8. 3 රජයේ සේවයේ යෙදී සිටින අනියම් සේවකයෝ.**—(අ) දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරන 1973 අප්‍රේල් මස 1 වැනි දිනට අඩු වශයෙන් එක් අවුරුද්දක සේවා කාලයක්වත් සම්පූර්ණ කර ඇති අනියම් තනතුරු දරන නිලධාරීන්ටද ඉහත 5 (iii) වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපනික සුදුසුකම් ලබා තිබේනම් මෙම විභාගය සඳහා පෙනී සිටීමට පුළුවන.

**9. අයදුම් පත්.**—(i) මේ විභාගය සඳහා වූ ආදර්ශ අයදුම්පත් ෆෝර්මයක් මේ නිවේදනය අග පළකර ඇත. අයදුම්කරුවන් විසින්, තමන්ගේ අයදුම්පත් ඊට අනුව ෆුල්ස්කැප් ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගත යුතුය. අයදුම් පත්‍රය සඳහා පාවිච්චි කළ යුත්තේ එක කඩදාසියක් පමණි.

(ii) අයදුම් පත්‍ර 1973 පෙබරවාරි මස 26 වැනි දිනට හෝ ඊට පෙර හෝ කොළඹ 2, මැලේ වීදිය, තැපැල් පෙට්ටිය 1503, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

එකී දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම් පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. විභාගයේ නාමත්, තමා විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානයත් ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළින් පැහැදිලිව සටහන් කළ යුතු ය. (විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන මෙහි I වැනි ඡේදයෙහි දක්වා ඇත.)

(iii) අයදුම් පතට රුපියල් 40 ක් වටිනා මුද්දර අලවා අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහ දාතම යොදා මුද්දර විධි ප්‍රකාරව අවලංගු කළ යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් රුපියල් 20 ක් වටිනා මුද්දර අලවා තමාගේ අත්සන සහ දාතම යොදා එම මුද්දර නිසි ලෙස අවලංගු කළ යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත එහෙත් ස්ථිර, විශ්‍රාම වැටුප් රහිත සියලුම නිලධාරීන් රුපියල් 40 ක් වටිනා මුද්දර ඇලවිය යුතුය.)

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට රක්ෂාවේ යෙදී සිටින අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් එවනු ලබන අයදුම් පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු සි. 7 වැනි ඡේදය යටතේ සුදුසුකම්වලට හිමිකම් පාන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් සිය අයදුම් පත් එවිය යුත්තේ ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙනි. එසේ නොකරන ලද කිසියම් අයදුම් කරුවකු වෙතොත් ඔහු විභාගයට නුසුදුස්සකු කොට සළකනු ලැබේ. 1973 පෙබරවාරි මස 26 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස්ට ලැබෙන පරිදි යවන්නට කියන ඉල්ලීමකුත් සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ.

විභාග කොමසාරිස්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට අයදුම් පත් නො එවිය යුතුය.

(v) අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුය. එනම් සමාදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවෙකු, මහජන නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගඟන, යුද්ධහමුදාවක කොමිෂන් නිලධාරියෙකු, රුපියල් 4,800 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කෙනෙකු විසිනි.

**10. විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර පරිපාලන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතු වේ. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

ඉල්ලුම්කරුවෝ තම තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුත්තාහුය. යම්කිසි ඉල්ලුම්කරුවකු තමාට නියමිත විභාග ශාලාවෙන් පිටස්තරව අන්‍ය ශාලාවකට ඇතුල්වූවහොත් ඔහුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

ප්‍රවේශ පත්‍රය සමග කාල සටහන් පිටපතක් ද අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් වෙත යවනු ලබේ. විභාගයට පෙනී සිටින්නාවූ සෑම අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක විසින්ම විභාග පවත්වන දිනයෙහි ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාග පරිපාලන නිලධාරි තැනට භාර දිය යුතුයි.

සියළුම විභාග අපෙක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනය අග පළවේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටිති.

සම්කිසි ඉල්ලුම්කරුවකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණොත් ඔහු විසින් ඒ බව වහාම—

"විභාග කොමසාරිස්,
තැපැල් පෙට්ටිය 1503,
මැලේ වීදිය,
කොළඹ 2"

යන ලිපිනයට දැනුම් දිය යුතුයි. (විදුලි පණිවුඩ යවන ලිපිනය: "විභාග" කොළඹ කියෑවේ.) ප්‍රවේශ පත්‍රය තමාට නොලැබුන බව

විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් ඔහු/ඇය දැනුවත්වම අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය සිතාමතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් හෝ එසේ නැතහොත් ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමට නුසුදුසුව සිටි බව ඔහු/ඇය සේවය කරන කාලයේ කවර අවස්ථාවකදී හෝ ඔප්පු වුවහොත් අප්‍රමාදව සේවයෙන් පහ කිරීමට පිළිවන.

නිවේදනයේ සඳහන් නියමයන් සම්පූර්ණයෙන් පිළි නොපදින අයවලුන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

14. **මුදල් ආපසු දීම.**—කවර කරුණක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මේ විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කරන්නට නො පිළිවන.

15. **ආණ්ඩුවේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—විභාග කොමසාරිස් විසින් අනුමත කරන ලද ඉල්ලුම් පත්‍ර ඇති ආණ්ඩුවේ සේවය කරන නිලධාරීන්ට ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු (රාජකාරී නිවාඩු නොවේ) දිය යුතුයි.

16. **විභාග පරිපාටිය.**—පහත සඳහන් වන්නේ විභාගයේ විෂයයන් සහ ඒවාට නියමිත ලකුණු ගණනයි. සෑම උත්තර පත්‍රයකම නරක අත් අකුරුවලට සහ අක්ෂර වින්‍යාසයේ දෝෂවලට ද ලකුණු අඩු කරනවා ඇත. කියවීමට නොහැකි අකුරු ලියන අපේක්ෂකයන් විභාගයට නුසුදුස්සන් හැටියට තීරණය කළ හැකිය.

| I වන කොටස | ලකුණු |
|---|---|
| (1) සිංහල වාක්‍ය රචනය (පැය 1යි) ... ... | 50 |
| (2) සිංහල ලඝු ලේඛනය—මිනිත්තුවකට වචන 70 ගණනේ මිනිත්තු 5 ක් තුළ කියවනු ලබන පාඨ ලඝු හනින් ලියාගෙන එය මිනිත්තුවකට වචන 5 ගණනේ සාමාන්‍ය විධියට ලිවීම ... | 150 |
| (3) සිංහල යතුරු ලිවීම—වචන 400 කින් පමණ සමන්විත පාඨයක් නිවැරදිව මිනිත්තු 20 ක් ඇතුලත යතුරු ලිවීම එනම්, මිනිත්තුවකට වචන 20 ගණනේ යතුරු ලිවීම ... ... | 100 |

**සැලකිය යුතුයි.**—(i) පරීක්ෂණ පැවැත්වෙන දින දී ප්‍රයෝජනය සඳහා තමන්ගේම ටයිප් ගසන යන්ත්‍ර රැගෙන ආ යුතු ය.

(ii) එසේ කළ නොහැකි අපේක්ෂකයන්ට/අපේක්ෂිකාවන්ට කම කාමන් අතරේ එක ටයිප් ගසන යන්ත්‍රයක් පාවිච්චි කිරීමට පිළියෙළ කර ගැනීමට ඉඩ දෙනු ලැබේ. එක් දිනක දී එම ටයිප් ගසන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙළ කර ගන්නා අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ ගණන හතරට වැඩි විය යුතු නොවේ. එසේ කරන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ඔවුන් අතුරෙන් පළමුවෙන් ටයිප් ගැසීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අපේක්ෂකයාට/අපේක්ෂිකාවට නියම දිනයේ දී විභාගය පවත් ගැනීමට ප්‍රථම විභාග මධ්‍යස්ථානය භාර නිලධාරි තැන වෙත ගොස් දැනුම් දිය යුතු යි. එක් එක් අපේක්ෂකයාට/අපේක්ෂිකාවට නියම වී ඇති දිනය නොතකා එම අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් සියල්ලම එක දිනයෙහිම විභාග මධ්‍යස්ථානය භාර තැන පරීක්ෂණය කරනවා ඇත. ඒ සම්බන්ධව යොදා ගෙන ඇති වැඩ පිළිවෙල පිළිබඳව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් අන් දැන්වීමක් දීම වුවමනා නොවේ.

(iii) මෙම විභාගය සඳහා පෙනී සිටින 1973 අප්‍රේල් මස 1 වැනි දින වන විට සිය පත්වීම ස්ථිර කර ඇති රජයේ සියළුම නිලධාරීන්ට තමන්ගේ විභාග ශාලාව වෙත කාර්යාලයීය යතුරු ලියන යන්ත්‍ර රැගෙන යාමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවසර දෙනු ලැබේ. එහෙත් මෙම අනුග්‍රහයෙන් ප්‍රයෝජනය ගන්නා සෑම නිලධාරියකු ගෙන්ම යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව ආපසු භාර දෙන බවටත් ඒවා පරිහරණය කිරීමේ දී සිදුවන අලාභහානි ආදියක් වේතොත් ඒවාට වගකියන බවටත් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානීණ විසින් ලබා ගත යුතු ය.

(iv) ඉහත (ii) වැනි ඡේදය යටතේ දී ඇති අවසරය හැරුණු විට තමාගේම ටයිප් ගැසීමේ පරීක්ෂණය සඳහා අපේක්ෂකයකු/අපේක්ෂිකාවක හට දී තිබෙන දිනයෙහි වෙනසක් කර ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමකට සාමාන්‍යයෙන් ඉඩ දෙනු නොලැබේ.

(v) විභාග කොමසාරිස් විසින් විභාග ශාලාවේ දී ටයිප් ගැසීමේ යන්ත්‍ර සපයනු නොලැබේ.

(vi) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නිසි ශෝභන පිළිවෙල නිර්වද්‍යතාව සහ වේගය ගණන් ගනු ලැබේ.

| II වන කොටස | ලකුණු |
|---|---|
| (4) සම්මුඛ පරීක්ෂණය ... ... | 50 |

විභාගය පැවැත් වෙන්නේ කොටස් දෙකකිනි. ඉහත සඳහන් (1), (2) සහ (3) විෂයයන් අඩංගු 1 වන කොටස මුලින් පවත්වා එහි ප්‍රතිඵල අනුව අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා තරඟ ක්‍රමයට තෝරා ගන්නවා ඇත. කොළඹ දී පවත්වනු ලබන මේ සම්මුඛ පරීක්ෂණයේ දිනය ඔවුන්ට කල්තියා දැනුම් දෙනවා ඇත. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ගණන නියම කරනු ලබන්නේ විභාග කොමසාරිස්ගේ ද අදහස් විමසා ක්‍රියා කරන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් විසිනි. සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් දක්වන අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ ගණන පුරප්පාඩු ගණනට වඩා අඩු වුවහොත්, සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට ඉඩ තිබේ.

17. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ පත්වීම් දීම.**—සමර්ථවන අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කර සුදුසු පුරප්පාඩු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනවා ඇත.

18. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්වීම් දීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින් ද සාමාර්ථය ලැබිය යුතු ය.

19. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම්, රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්ගේ කැමැත්ත පරිදි තීරණය කෙරෙනු ඇත.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 ජනවාරි මස 23 දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දීය.

**ආදර්ශ අයදුම් පත**

**ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**විභාග අංකය :**

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.)**

**රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1973 අප්‍රේල්**

1. මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
   ස්ත්‍රී පුරුෂ භාවය :————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
3. සම්පූර්ණ ලිපිනය :————.
   (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයින් කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුය.)
4. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද නැත හොත් ලියාපදිංචි වීමෙන් ද යන වග :————.
5. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති ස්ථානය :—
   පළමුවන තේරීම :————.
   දෙවන තේරීම :————.
6. සුදුසුකම් :—
   (අ) විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇත්තේ පිළිබඳ ගැසට් නිවේදනයේ කුමන ඡේදය යටතේ යන බව :————.
   (ආ) උපන් දිනය :————.
   (ඇ) අධ්‍යාපනික සුදුසුකම් :—
      (i) විභාගයේ නම, පැවැත්වූ වර්ෂය හා මාසය ————.
      (ii) විභාග මධ්‍යස්ථානය හා විභාග අංකය :————.
      (iii) සමත් වූ විෂයයන් :————.
      (සම්මාන සඳහන් කළ යුතු අතර එක් එක් විභාගයේ විස්තර වෙන වෙනම සඳහන් කළ යුතුය.)
   (ඈ) විභාගයට පෙනී සිටීමට ඔබේ ඇති සුදුසුකම් පිළිබඳ අනිකුත් විස්තර :————.

7. ඔබ ආණ්ඩුව යටතේ කළ රක්ෂාවන් ද ඇතුළුව මීට කලින් කරන ලද රක්ෂාවල් ද ඒ ඒ රක්ෂාවල යෙදී සිටි කාලය ද, ඒ එක එකින් අස් වී යාමට හේතු ද දක්වන්න :—

(i) වෙළඳ ආයතනයේ/සේවයාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ නම :————.

(ii) රක්ෂාවේ ස්වභාවය :————.

(iii) සේවා කාලය :———— සිට ———— දක්වා.

(iv) එම රක්ෂාවෙන් අස් වී යාමට හේතු වූ කරුණු : ————.

8. ඔබ කිසියම් වරදකට කවදා හෝ වරදකරු කරනු ලැබ තිබේනම් හෝ චෝදනා කරනු ලැබ තිබේ නම් හෝ සිතාසි කරනු ලැබ තිබේ නම් හෝ ඒ බව සඳහන් කරන්න. එසේ නම් ඒ දිනය ද වරදේ ස්වභාවය ද උසාවියේ නම ද නඩු නොම්මරය ද සඳහන් කරන්න :————.

9. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නොකරන ලද්දාවූ වලංගු මුද්දර බවත් මෙයින් දිවුරා සහතික කරමි.

(ii) මේ විභාගය හා සම්බන්ධ නීති රීතිවලට ද යටත් වීමට එකඟ වෙමි.

10. මුද්දර කොටුව.—අයදුම්පතට රුපියල් 40 ක් වටිනා මුද්දර අලවා අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහ දාතම යොදා මුද්දර විධිප්‍රකාරව අවලංගු කළ යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් රුපියල් 20 ක් වටිනා මුද්දර අලවා තමාගේ අත්සන සහ දිනය යොදා එම මුද්දර නිසි ලෙස අවලංගු කළ යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත, එහෙත් ස්ථිර විශ්‍රාම වැටුප් රහිත සියලුම නිලධාරීන් රුපියල් 40ක් වටිනා මුද්දර ඇලවිය යුතුය.)

| |
|---|
| රු. 40 රු. 20 |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

*————සේවයේ නියුක්ත/පදිංචි————නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1973————මස———— වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.

නම, පදවිය හා තරාතිරම :————.

ලිපිනය :————.

* දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි.

ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපේක්ෂකයින් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුයි. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන විගකිව යුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියා සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ටද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළු වන විටත් ඉන් පිට වන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වා ගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය භාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලවෙන් පිට වී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණ වලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අත්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීමේ ඇදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැලකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි). විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙතැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දක්වීමත්, චිත්‍රකර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යෑම තහනම්ය. මේ සියලු දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය

කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාර්ඩ්බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලවුන් පේපර් යනාදිය විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටීමේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම්ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදව් දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුයි.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වූවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාගශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න, ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත්, හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඬේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහායි. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුය. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැන්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකුසේ සළකනු ලබීමට ද හේතු විය හැකි ය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

2–99—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

අංකය 1/83/28 (ජී).

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය (ඉංග්‍රීසි)— 1971 නොවැම්බර් 13**

අංක 134 (ජී) 1966 ඔක්තෝබර් මස 23 වැනි දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සහ අංක 170 (ජී) 1968 පෙබරවාරි මස 7 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ දක්වෙන පරිපාටියේ ප්‍රකාර 1971 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රුපියල් 5,736 ක් වීමට පෙර ඇති II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී පහත නම් සඳහන් නිලධාරියා ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් විෂයයෙන් සමත් වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය |
|---|---|---|
| සතානාදන්, එස්. සී.... | නාගරික මහේස්ත්‍රාත් උසාවිය,... කොළඹ 10 | ලඝු ලේඛනය හා ටයිප් ගැසීම |

2. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇති ඉහත නම සඳහන් අපේක්ෂකයා ද මීට පෙර සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලු කර ගැනීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුය.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

2–100—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙනසේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් .. ... | 43 | 50 | ... | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණ ය.

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී එක කොටසක් ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ ඡේදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 | සිකුරාද | 72.12.27 | බදාද | දවල් 12.00 |
| | 73. 1.12 | සිකුරාද | 73. 1. 3 | බදාද | දවල් 12.00 |
| | 73. 1.19 | සිකුරාද | 73. 1.10 | බදාද | දවල් 12.00 |
| | 73. 1.26 | සිකුරාද | 73. 1.17 | බදාද | දවල් 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 | සිකුරාද | 73. 1.24 | බදාද | දවල් 12.00 |
| | 73. 2. 9 | සිකුරාද | 73. 1.31 | බදාද | දවල් 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්ද | 73. 2. 7 | බදාද | දවල් 12.00 |
| | 73. 2.23 | සිකුරාද | 73. 2.14 | බදාද | දවල් 12.00 |
| මාර්තු | 73. 3. 2 | සිකුරාද | 73. 2.21 | බදාද | දවල් 12.00 |
| | 73. 3. 9 | සිකුරාද | 73. 2.28 | බදාද | දවල් 12.00 |
| | 73. 3.16 | සිකුරාද | 73. 3. 7 | බදාද | දවල් 12.00 |
| | 73. 3.23 | සිකුරාද | 73. 3.14 | බදාද | දවල් 12.00 |
| | 73. 3.30 | සිකුරාද | 73. 3.21 | බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | 73. 4. 4 | සිකුරාද | 73. 3.28 | බදාද | දවල් 12.00 |
| | 73. 4.11 | බදාද | 73. 4. 4 | බදාද | දවල් 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්ද | 73. 4.11 | බදාද | දවල් 12.00 |
| | 73. 4.27 | සිකුරාද | 73. 4.18 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.